සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவமாகாணக்கல்விதிணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2024 -
අවසාන වාර පරීක්ෂණය

ගිණුම්කරණ 1
Accountir

33 S I

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

කාලය පැය 2

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න

අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරිමත ලියන්න

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ.

1 කළමනාකරණ ගිණුම්කරණයේ මූලික අරමුණු වඩාත් හොඳින් විස්තර වන පිළිතුර වන්නේ.

(1) අභ්‍යන්තර පාර්ශවයන්ට අනාගත තොරතුරු පමණක් සැපයීම.
(2) කළමණාකාරීත්ව තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම.
(3) ආයතනය සම්බන්ධ මූල්‍ය නොවන තොරතුරු ඇල්මැති පාර්ශව වෙත සැපයීම.
(4) ව්‍යාපාරය සම්බන්ධ නෛතික අවශ්‍යතා සපුරාලීමට තොරතුරු සැපයීම
(5) ව්‍යාපාරය සම්බන්ධ තොරතුරු ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට සැපයීම. (.........)

2 ගිණුම්කරණ සංකල්ප සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A- විකුණුම් අත්තිකාරමක් ලැබීම භාණ්ඩ විකිණීමක් ලෙස උපලබ්ධි සංකල්පයෙන් හඳුනා ගැනේ.
B- නීත්‍යානුකූල අයිතිය නොමැති වුවද භාවිත අයිතිය සහිත වත්කම්,වත්කම් ලෙස යථානුරූපී සංකල්පයට අනුව හඳුනා ගැනේ.
C- දළ ලාභය ගණනය කිරීමේදී විකුණුම් වලින් විකුණුම් පිරිවැය අඩුකිරීම ගැළපුම් සංකල්පය පදනම් කරගෙන සිදු කරයි.

(1) A පමණි.
(2) B පමණි.
(3) B හා C පමණි
(4) A හා B පමණි.
(5) A,B,C යන සියල්ලම. (.........)

3 ව්‍යාපාරයක් පෙර වර්ෂ පහක් තුළදී භාවිත කල WAC තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය පැහැදිලි හේතුවකින් තොරව FIFO ක්‍රමයට මාරු කරන ලදී. මෙමගින් කඩවන ගිණුම්කරණ සංකල්පය වනුයේ?

(1) ඒකක සංකල්පය

(2) මූල්‍ය මිනුම් සංකල්පය

(3) ආරක්ෂණ සංකල්පය

(4) සංගතතා සංකල්පය

(5) අඛණ්ඩ පැවැත්ම සංකල්පය (.........)

- **4 හා 5 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කර ගන්න**

එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති පියල් සමාගම 2024.02.10 දින රු.**805,000** ක භාණ්ඩ නර්මදා ට්‍රේඩර්ස් වෙතින් ණයට මිලදී ගන්නා ලදී. මෙම ඉන්වොයිස් අගය තුල 15% ක VAT ඇතුළත් වේ. මෙම භාණ්ඩ වලින් ඉන්වොයිස් අගය වූ රු. 230,000 ක් භාණ්ඩ ඉල්ලූ වර්ගයට වෙනස් වීම මත නර්මදා ට්‍රේඩර්ස් වෙත ආපසු යවන ලදී. පියල් සමාගම නර්මදා ට්‍රේඩර්ස් වෙත ගෙවිය යුතු මුළු මුදල 2024.02.28 දින ගෙවන ලදී.

4 ඉහත සඳහන් සියලු ගනුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙල අනුව සීමිත පියල් සමාගමේ පොත්වල සටහන් කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලේඛන වනුයේ,

(1) ඉන්වොයිසිය, හරපත, ලදුපත

(2) ඉන්වොයිසිය,බැරපත,ලදුපත

(3) ජර්නල් වවුචරය, බැරපත,ලදුපත

(4) ඉන්වොයිසිය,හරපත,ගෙවීම් වවුචරය

(5) ඉන්වොයිසිය,ගෙවීම් වවුචරය,හරපත (.........)

5 2024.02.10 දින ණයට ගන්නා ලද භාණ්ඩ පියල් සමාගමේ පොත්වල සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

	ගිණුම	හර	බැර	
(1)	ගැනුම් ගිණුම	805000		
	ණයහිමි පාලන ගිණුම		**805000**	
(2)	ගැනුම් ගිණුම	**700000**		
	ණයහිමි පාලන ගිණුම		**700000**	
(3)	ගැනුම් ගිණුම	**700000**		
	VAT පාලන ගිණුම	105000		
	ණයහිමි පාලන ගිණුම		805000	
(4)	ගැනුම් ගිණුම	805000		
	VAT පාලන ගිණුම		105000	
	ණයහිමි පාලන ගිණුම		**700000**	
(5)	ගැනුම් ගිණුම	805000		
	VAT පාලන ගිණුම	**105000**		
	ණයහිමි පාලන ගිණුම		910000	(.........)

6 පහත දී ඇති තොරතුරු අනුව නවෝද් ව්‍යාපාරයේ **2023/04/01** දිනට ශුද්ධ වත්කම් වන්නේ කීයද?

	රු **000**
2024/03/31 දිනට ශුද්ධ වත්කම්............................	840
වර්ෂයේ ලාභය..	210
වර්ෂය තුලදී අයිතිකරු විසින් මුදල් ගැනිලි................	120
වර්ෂය තුලදී අයිතිකරු විසින් භාණ්ඩ ගැනිලි..............	10

(1) රු 1050

(2) රු **630**

(3) රු **330**

(4) රු **760**

(5) රු **130** **(.........)**

7 පසුගිය වර්ෂයේ කපාහල බොල්ණය ප්‍රවර්තන වර්ෂයේ මුදලින් ලැබීමෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම වන්නේ

(1) වගකීම් අඩුවේ හිමිකම් වැඩිවේ.
(2) වත්කම් වැඩිවේ වගකීම් වැඩිවේ
(3) වත්කම් අඩුවේ හිමිකම් අඩුවේ
(4) හිමිකම් අඩුවේ වගකීම් වැඩිවේ
(5) වත්කම් වැඩිවේ හිමිකම් වැඩිවේ **(.........)**

8 දිලෙන තරු ක්‍රීඩා සමාජයේ **2024.03.31** දිනෙන් අවසන් වර්ෂය සදහා පහත තොරතුරු සපයා ඇත.

	රු**000**
2023.04.01 ලැබිය යුතු සාමාජික මුදල්...	**60**
2023.04.01 කලින් ලද සාමාජික මුදල්..	**20**
වර්ෂය තුල කපාහරින ලද පසුගිය වර්ෂයේ හිගහිටි සාමාජික මුදල්.................	**60**
වර්ෂයේ සාමාජික මුදල් ආදායම..	**1200**
2024.03.31 ලැබිය යුතු සාමාජික මුදල්..	**50**
2023.03.31 ට ඉදිරියට ලද සාමාජික මුදල්...	**60**

2024.03.31 **දිනෙන් අවසන් වර්ෂය තුල මුදලින් ලද සාමාජික මුදල කීයද?**

(1) රු**.1,100,000**

(2) රු**.1,150,000**

(3) රු**.1,190,000**

(4) රු**.1,200,000**

(5) රු**.1,220,000** **(.........)**

9 අංක 9,10 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.
ව්‍යාපාරයක් එහි සියළු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුම මගින් සිදු කරන අතර 2024.01.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු.720,000 ක් වූ නමුත් මුදල් ගිණුමේ ශේෂය ඊට වඩා වෙනස් විය. පසුව පහත කරුණු අනාවරණය විය.

- රු 70,000 ක නිකුත් කළ චෙක්පතක් බැංකුවට ඉදිරිපත් වී නොමැත.
- 01/31 දින තැන්පත් කළ රු 40,000 ක චෙක්පත උපලබ්ධි වී ඇත්තේ 02/02 දිනය
- රක්ෂණය සඳහා රු.8000 ක ස්ථාවර නියෝග ගෙවීම මුදල් ගිණුමේ සටහන් කර නොමැත.
- රු. 25,000 ක සෘජු ණයගැති ප්‍රේෂණ මුදල් ගිණුමේ සටහන් වී නොමැත.

2024.01. 31 දිනට මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය කීයද?

(1) රු. 690,000

(2) රු. 700,000

(3) රු. 720,000

(4) රු. 740,000

(5) රු. 760,000 (.........)

10 2024.01. 31 දිනට බැංකු ප්‍රකාශනය ලැබීමට පෙර පැවති මුදල් ගිණුමේ පැවති ශේෂය කීයද?
(1) රු. 667,000
(2) රු. 668,000
(3) රු. 670,000
(4) රු. 673,000
(5) රු. 675,000 (.........)

11 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරලිය ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

රු 000
2023.04.01 දිනට අමුද්‍රව්‍ය තොගය...................250
2024.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය....................130
අමුද්‍රව්‍ය ගැනුම් 150
වර්ෂය තුළ නොනිමි තොගයේ වැඩිවීම............... 30
සෘජු ශ්‍රම පිරිවැය 50
නිෂ්පාදන ඒකක මත පුරස්කාර ගෙවීම 20
කර්මාන්ත ශාලා පොදු කාර්ය පිරිවැය 25
මුළු නිෂ්පාදන පිරිවැය මත පදනම්ව නොනිමි තොගය අගය කෙරේ.

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?

	ප්‍රාථමික පිරිවැය (000)	මුළු නිෂ්පාදන පිරිවැය (000)
(1)	320	315
(2)	340	335
(3)	320	365
(4)	340	365
(5)	400	335

(.........)

12 **2024.03.31** දිනට නලින්ගේ ව්‍යාපාරයේ වෙළඳ ලැබිය යුතු පාලන ගිණුමේ හා වෙළඳ ලැබිය යුතු දෑ ශේෂ ලැයිස්තුවේ ශේෂ එකිනෙකට සමාන නොවන ලදී. පසුව පහත තොරතුරු සොයා ගන්නා ලදී.

- **2024.03.31** දිනට වෙළඳ ලැබිය යුතු පාලන ගිණුමේ ශේෂය රු.**35,000**කි.
- විකුණුම් ජර්නලයෙන් රු.**5000** ක විකුණුමක් මගහැරී ඇත.
- උප ලෙජරයේ ගිණුමක රු.**5,000** ක විකුණුමක් මග හැරී ඇත.
- අමල්ට භාණ්ඩ විකිණීමේදි දුන් රු. **200** ක වෙළඳ වට්ටම රු.**2,000** කලෙස ඔහුගේ ගිණුමේ සටහන් කර ඇත.
- **2024.03.31** දිනට පිළියෙල කර තිබූ ශේෂ ලැයිස්තුවේ ශේෂය කොපමණද?

(1) රු. **23,900**
(2) රු.**40,300**
(3) රු. **28,800**
(4) රු. **28,000**
(5) රු. **23,000** **(.........)**

13 අමායා හා විමායා විසින් **4:3** අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය ව්‍යාපාරයට හිමායා හවුල්කරුවකු ලෙස බැඳුනි. නව ලාභ අලාභ අනුපාතය අමායා,විමායා හා හිමායා අතර **3:3:2** කි. හිමායා තම කීර්තිනාම කොටස ලෙස රු.**70,000** ක් මුදලින් ගෙන ආවේ නම්, එය අමායා හා විමායා බෙදාගන්නේ කුමන ආකාරයටද ?

(1) අමායා **35,000,** විමායා **35,000**
(2) අමායා **50,000,** විමායා **20,000**
(3) අමායා **40,000,** විමායා **30,000**
(4) අමායා **30,000,** විමායා **40,000**
(5) අමායා **55,000,** විමායා **15,000** **(.........)**

14 ධනුජ හා සෙනුමිත විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ **2024** වර්ෂයේ පොත්වල රු. **385,000** ක දළ ලාභයක් පෙන්නුම් කරන ලදී. පහත අතිරේක තොරතුරුද සපයා ඇත.

මෙහෙයුම් වියදම...රු **170,000**
ධනුජට ගෙවිය යුතු ප්‍රවාහන වියදම...රු **5,000**
සෙනුමිත වර්ෂය ආරම්භයේදී ව්‍යාපාරයට සපයා ඇති ණය මුදල රු **50,000** කි.

- වාර්ෂික වේතන
  ධනුජ - **16,000**
  සෙනුමිත - **24,000**

- ප්‍රාග්ධන පොලිය
  ධනුජ - **20,000**
  සෙනුමිත - **30,000**

මෙම හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කල හැකි ලාභය වන්නේ

(1) **215,000**
(2) **212,500**
(3) **207,500**
(4) **210,000**
(5) **117,500** **(.........)**

15 **2024.03.31** කලිදු පොදු සමාගමේ හටගත් ගින්නක් හේතුවෙන් එදින පැවති තොගයෙන් කොටසක් විනාශ විය.

2024.03.31 න් අවසන් වසරට අදාලව පහත තොරතුරු සපයා ඇත.

	රු 000
2023.04.01 දිනට තොගය......................	**1,200**
ගැනුම්..	**3,800**
විකුණුම්..	**4,500**
විකුණුම් වියදම්......................................	**300**
ආපසු යැවුම්..	**500**
ගින්නෙන් බේරාගත් තොගය.....................	**400**

විකුණුම් මිල මත **20%** ක ලාභයක් තබා ගනිමින් සමාගම භාණ්ඩ විකුණනු ලබයි නම් **2024.03.31** දින විනාශ වූ තොගයේ අගය කොපමණද?

(1) රු **740,000**
(2) රු **500,000**
(3) රු **350,000**
(4) රු **900,000**
(5) රු **750,000** (.........)

16 මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව මූල්‍ය ප්‍රකාශන මූලිකාංග මිනුම් කිරීම සඳහා යොදාගන්නා මිනුම්කරණ පදනම වනුයේ,

(1) සාධාරණ අගය හා ඓතිහාසික පිරිවැය
(2) ප්‍රයෝජ්‍ය අගය හා ප්‍රවර්ථන අගය
(3) ඓතිහාසික පිරිවැය හා ප්‍රවර්ථන අගය
(4) ඓතිහාසික පිරිවැය හා ප්‍රවර්ථන පිරිවැය
(5) ප්‍රවර්ථන අගය හා සාධාරණ අගය (.........)

17 එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වූ සමාගමක් මිලදී ගත් යන්ත්‍රයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

දිනය	විස්තරය	වටිනාකම (රු)
2023.04.01	යන්ත්‍ර ආනයනය කිරීම (**15%** VAT සහිතව)	**690 000**
2023.04.20	යන්ත්‍ර ගෙන ඒමේ වියදම	**100 000**
2023.04.30	ස්ථානය සකස් කර යන්ත්‍රය සවි කිරීමේ වියදම	**40 000**
2023.05.20	මූලික පරීක්ෂණ වටයේ වියදම් • වෘත්තීය ගාස්තුව • මූලික නිෂ්පාදන වටයට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම	 **120 000** **30 000**
2023.05.30	විවෘත කිරීමේ උත්සවය සඳහා	**25 000**
2023.06.05	මූලික පරීක්ෂණ වටයේ නිපදවූ අයිතම විකිණීමෙන් මුදල් ලැබීම.	**20 000**

දේපල පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව මෙම යන්ත්‍රයෙහි හඳුනා ගැනීමේ පිරිවැය හා ක්ෂය කිරීම ආරම්භ වන දිනය වන්නේ.

	පිරිවැය	දිනය
(1)	**745 000**	**2023.05.30**
(2)	**720 000**	**2023.06.05**
(3)	**870 000**	**2023.05.20**
(4)	**860 000**	**2023.05.20**
(5)	**740 000**	**2023.05.20**

(.........)

18 සීමිත එරංග පොදු සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. **2023.04.01** දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන රු. **450 000** ක් විය. **2024.03.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා "ගෙවූ වගකීම් සහතික වියදම" හා "හඳුනාගත් වගකීම් සහතික වියදම" පිළිවෙලින් **350 000** හා **525 000** ක් විය. LKAS 37 (ප්‍රතිපාදන,අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට අනුව **2024.03.31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත යුතු වගකීම් සහතික ප්‍රතිපාදනය කොපමණ ද?

(1) **875 000**
(2) **975 000**
(3) **625 000**
(4) **100 000**
(5) **525 000** (.........)

19 LKAS **08** " ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් හා වැරදි " ප්‍රමිතයට අනුව පහත දැක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේද?

A ප්‍රායෝගිකව සිදුකල නොහැකි අවස්ථාවල හැර පෙර කාලච්ඡේද වල ප්‍රමාණාත්මක වැරදි, මූල්‍ය ප්‍රකාශවල අතීතයානුයෝගීව නිවැරදි කරනු ලබයි.

B යන්ත්‍රවල ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරු කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීමක් ලෙස සැලකේ.

C තොග ආගණනය සඳහා යොදාගත් පෙර පිවිසි - පෙර පිට (FIFO) ක්‍රමය භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට (WAC) වෙනස්වීම ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීමක් ලෙස සැලකේ.

(1) B පමණි.

(2) A පමණි.

(3) A හා B පමණි.

(4) B හා C පමණි.

(5) A හා C පමණි. (.........)

20 සීමිත විහඟ පොදු සමාගමේ **2024.03.31** දිනෙන් අවසන් වර්ෂයට අදාල තොරතුරු පහත දැක්වේ.

	රු 000
විකුණුම්	3600
විකුණුම් පිරිවැය	760
වෙනත් ආදායම්	130
පරිපාලන වියදම්	240
බෙදා හැරීමේ වියදම්	185
වර්ෂයේ බදු	120

2023.04.01 දින ව්‍යාපාරය සතු ඉඩම දෙවන වරට ප්‍රත්‍යාගණනය කළ අතර එමගින් රු.**220 000** අලාභයක් ඇති විය. මෙම ඉඩම **2022.04.01** දින කරන ලද ප්‍රථම ප්‍රත්‍යාගණනයෙන් රු. **180 000** අතිරික්තයක් ලබා තිබුණි. ඉඩම් ප්‍රත්‍යාගණනය පිලිබඳව කිසිදු සටහනක් මෙතෙක් පොත්වල වාර්තා වී නොතිබිණි.

ඉහත ගැලපීමෙන් පසු **2024.03.31** දිනෙන් අවසන් වර්ෂයට අදාල කාලච්ඡේදයේ ලාභය හා මුළු විස්තීර්ණ ආදායම වන්නේ?

	කාලච්ඡේදයේ ලාභය (රු.000)	මුළු විස්තීර්ණ ආදායම (රු.000)
(1)	**2095**	**2535**
(2)	**2385**	**2205**
(3)	**2315**	**2455**
(4)	**2970**	**2275**
(5)	**2275**	**2175**

(.........)

21 SLFRS 16 (ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් පැන නගින අයහාරය) ප්‍රමිතයට අනුව පහත ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශ/ප්‍රකාශය වන්නේ,

A - ගනුදෙනුකරුවෙකු සමග ඇතිවන ගිවිසුමක "කාර්ය සාධන බැඳීම්" කිහිපයක් ඇතුළත් විය හැක.

B - ව්‍යාපාර ආයතනයක අයහාරය හා අනෙකුත් සියලු ආදායම් SLFRS 16 ප්‍රමිතයට අනුකූලව පමණක් මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගත යුතුය.

C - ආයතනයක් විසින් ගිවිසුමක් මත අයහාරය හඳුනා ගත යුත්තේ ගිවිසුමට එළඹෙන අවස්ථාවේදීය.

(1) A හා B පමණි
(2) A පමණි.
(3) B හා C පමණි.
(4) B පමණි.
(5) A,B,C යන සියල්ලම. **(.........)**

ප්‍රශ්න අංක **22** හා **23** සඳහා පහත තොරතුරු භාවිතා කරන්න

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සාලින්ද පොදු සමාගම පහත තොරතුරු සපයා ඇත.

	රු 000
විකුණුම්	**8000**
විකුණුම් පිරිවැය	**4200**
2023.04.01 දිනට නිමි භාණ්ඩ තොගය	**700**
2024.03.31 දිනට නිමි භාණ්ඩ තොගය	**500**
මෙහෙයුම් වියදම්	**800**
පොලී වියදම්	**500**
බදු වියදම්	**250**

2024.03.31 දිනට නිකුත් කර තිබූ සාමාන්‍ය කොටස් ගණන **200 000**ක් වූ අතර මෙදිනට ව්‍යාපාරයේ හිමිකම රු **5 000 000** විය.

22 සමාගමේ තොග පිරිවැටුම් අනුපාතය හා පොලී ආවරණ අනුපාතය

	තොග පිරිවැටුම් අනුපාතය (වාර)	පොලී ආවරණ අනුපාතය (වාර)
(1)	**6**	**4**
(2)	**7**	**6**
(3)	**7**	**5**
(4)	**6**	**5**
(5)	**6**	**6**

(.........)

23 සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය සහ කොටසක ඉපයුම

	සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (%)	කොටසක ඉපයුම(රු)
(1)	45	රු. 11.25
(2)	20	රු. 5.25
(3)	40	රු. 11.00
(4)	45	රු. 5.00
(5)	25	රු. 7.25

(.........)

24 ව්‍යාපාරයක ආරම්භක තොගය රු.50000 කින් වැඩියෙන් සටහන් වී තිබූ අතර, අවසාන තොග ශේෂය රු 60000 කින් අඩුවෙන් සටහන් වී තිබුණි. මෙම වැරදි වලින් ලාභය කෙරෙහි සිදු කරන බලපෑම වන්නේ,

(1) ලාභය රු 10,000 ක් වැඩියෙන් සටහන් වීමයි.
(2) ලාභය රු 10,000 ක් අඩුවෙන් සටහන් වීමයි.
(3) ලාභය රු 110,000 ක් අඩුවෙන් සටහන් වීමයි.
(4) ලාභය රු 110,000 ක් වැඩියෙන් සටහන් වීමයි.
(5) ලාභය රු 60,000 ක් අඩුවෙන් සටහන් වීමයි. (.........)

අංක 25 හා 26 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු යොදාගන්න

භාණ්ඩ වර්ග කිහිපයක් නිෂ්පාදනය කරන සීමිත නිපුනිකා සමාගමේ යන්ත්‍ර දෙපාර්තමේන්තුව, එකලස් දෙපාර්තමේන්තුව හා නිමවුම් දෙපාර්තමේන්තුව යනුවෙන් පිරිවැය මධ්‍යස්ථාන 03 ක් ඇත.

- සමාගමේ පිරිවැය ගණකාධිකාරී වරයා පහත දෑ ගණනය කර ඇත.

විස්තරය	යන්ත්‍ර දෙපාර්තමේන්තුව රු(000)	එකලස් දෙපාර්තමේන්තුව රු(000)	නිමවුම් දෙපාර්තමේන්තුව රු(000)
පොදු කාර්ය පිරිවැය	20,000	45,000	40,000
පොදු කාර්යය අන්තර්ග්‍රහණ අනුපාතය • යන්ත්‍ර පැයකට	2	-	-
• ශ්‍රම පැයකට	-	3	4
A නමැති නිෂ්පාදන ඒකකයක් මගින් අන්තර්ග්‍රහණය කළ පොදු කාර්ය.	10	18	16

ඉහත ගණනය කිරීම් වලදී පහත පොදු කාර්ය පිරිවැය මගහැරී තිබූ බවට සොයා ගන්නා ලදී.

- යන්ත්‍ර දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර අලුත්වැඩියාව.රු 10,000
- එකලස් දෙපාර්තමේන්තුවේ වැටුප් ගෙවීම. රු 30,000

25 සියළු පොදු කාර්ය පිරිවැය සැලකිල්ලට ගැනීමෙන් පසු ඒ ඒ පිරිවැය මධ්‍යස්ථානයන්හි නිවැරදි පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය වන්නේ.

	යන්ත්‍ර දෙපාර්තමේන්තුව(රු)	එකලස් දෙපාර්තමේන්තුව	නිමවුම් දෙපාර්තමේන්තුව
(1)	2	3	4
(2)	5	4	2
(3)	3	3	4
(4)	2	5	4
(5)	3	5	4

(.........)

26 සමාගම නිපදවන "A" භාණ්ඩයේ ප්‍රාථමික පිරිවැය රු 34ක් වන අතර භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය මත සියයට 10% ක ලාභයක් එකතු කරමින් "A" භාණ්ඩයේ මිල ලකුණු කරයි නම් "A" භාණ්ඩයේ නිවැරදි ලකුණු කළ මිල කීයද?

(1) රු **98**
(2) රු **104.50**
(3) රු **86.36**
(4) රු **51.70**
(5) රු **93** **(.........)**

27 නිෂ්පාදන ව්‍යාපාරයක් විසින් භාවිත කරන අමුද්‍රව්‍යයක යළි ඇනවුම් මට්ටම හා යළි ඇනවුම් ප්‍රමාණය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 1500 ක් හා කිලෝ ග්‍රෑම් 2500 ක් වේ.

මෙම අමුද්‍රව්‍ය යේ සතියක අවම පරිභෝජනය කිලෝ ග්‍රෑම් 150 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ අවම හා උපරිම පොරොත්තු කාලය පිළිවෙලින් සති 2 ක් හා සති 6 ක් වේ.

මෙම අමුද්‍රව්‍යයේ උපරිම තොග මට්ටම,

(1) 3700
(2) 3100
(3) 4000
(4) 6400
(5) 5800 **(.........)**

28 පිරිවැය ඒකකයක් සඳහා පොදුකාර්ය පිරිවැය හඳුනාගැනීමේ දී අනුගමනය කරන පියවර පහත දී ඇත. මෙම පියවරෙහි නිවැරදි අනුපිළිවෙල වන්නේ,

A පොදුකාර්ය පිරිවැය රැස් කිරීම
B පොදුකාර්ය පිරිවැය අන්තර් ග්‍රහණය කිරීම
C පොදුකාර්ය පිරිවැය ප්‍රතිපාදනය කිරීම
D පොදුකාර්ය පිරිවැය විභජනය කිරීම

(1) **A,B,C,D**
(2) **B,C,D,A**
(3) **A,C,D,B**
(4) **B,A,D,C**
(5) **A,C,B,D** **(.........)**

29 X නැමති භාණ්ඩයේ විකුණුම් මිල රු 260 කි. එහි දායක විකුණුම් අනුපාතය 40%කි. X භාණ්ඩයේ ඒකකයක විචල්‍ය පිරිවැය වන්නේ

(1) 136
(2) 173
(3) 156
(4) 200
(5) 326 **(.........)**

30 පහත කුමන සිදුවීම් ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය වැඩිවීමට බලපායිද?

A - වාර්ෂික මෙහෙයුම් පිරිවැය අඩුවීම
B - වට්ටම අනුපාතිකය වැඩිවීම
C - ආරම්භක ආයෝජන අඩු වීම

(1) A පමණි
(2) B පමණි
(3) A හා B පමණි
(4) A හා C පමණි
(5) A, B හා C යන සියල්ලම

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න

31 මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත ප්‍රකාශ සත්‍ය (T) අසත්‍ය ද (F) සදහන් කරන්න

(1) සංකල්පනාත්මක රාමුවෙහි හදුනාගෙන ඇති එකම බලපැවැත්වෙන උපකල්පනය වන්නේ අඛණ්ඩ පැවැත්මයි (.....)

(2) සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරු වල මූලික ගුණාත්මක ගති ලක්ෂණයක් වන්නේ සත්‍යාපනය කල හැකි බව හා කාලීන බවයි. (.....)

(3) ව්‍යාපාරයක ආදායමක් වත්කමක් ඉහලයාමකින් හෝ වගකීම් පහලයාමකින් ඇතිවිය හැකිය. (.....)

(4) වගකීමක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ වර්තමාන බැදීමයි. (.....)

32 පහත එක් එක් ගිණුම කුමන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගයට අයත් වේදැයි දක්වන්න

(1) උපචිත කොමිස් ආදායම් ....

(2) ගෙවූ ලාභාංශ ....

(3) ආපසු එවුම් ....

(4) වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ වෙන් කිරීම ....

33 පහත ගනුදෙනු සඳහා අදාල වන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත සටහන් කරන්න

	මූලාශ්‍ර ලේඛනය	මූලික සටහන් පොත
A රු. **65000** තොග ගින්නකින් හානි වීම	....	....
B රු.**1500 000** හිමිකම් නිකුතුවක් සිදු කිරීම	....	....
C පසුගිය වසරේ කපාහල බොල්ණය ආපසු ලැබීම රු.**8500**	....	....
D ණයගැතියකුගෙන් ලද මුදල් රු.**12000** අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගෙන ඇත	....	....

34 **2024.03.31** දිනට ව්‍යාපාරයක ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේදී පහත වැරදි අනාවරණය විය.

A **2024** මාර්තු මාසය සඳහා ආපසු එවුම් ජර්නලයේ එකතුව රු. **250 000** ක් හා ණයගැති පාලන ගිණුමට හා ආපසු එවුම් ගිණුමට රු. **520 000** ක් ලෙස පිටපත් කර තිබුණි.

B ණයගැතියකු විසින් ලබා දුන් රු. **12 000** මුදල මුදල් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇතත් ණයගැති පාලන ගිණුමට රු **1200** ක් ලෙස පිටපත් කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න.
(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)

	වැරැද්ද	හර (රු)	බැර (රු)
A			
B			

35 ව්‍යාපාරයක පහත දැක්වෙන එක් එක් අවස්ථාවල උල්ලංඝණය වී ඇති ගිණුම්කරණ සංකල්පය දක්වන්න

A කල්බදු දේපළ වත්කමක් ලෙස නොසැලකීම

....

B විකුණුම් අත්තිකාරමක් ලැබීම විකුණුම් ලෙස ගිණුම්ගත කිරීම

. ...

C දේපල පිරියත ක්ෂය කිරීම සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය වෙනුවට හීනවන ශේෂ ක්‍රමය යොදාගැනීම

. ...

D අයිතිකරුගේ විදුලි වියදම ව්‍යාපාරයේ මුදලින් ගෙවීම හා එය ව්‍යාපාරයේ විදුලි ගිණුමට පිටපත් කිරීම

....

36 ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

ප්‍රකාශන	සත්‍ය /අසත්‍ය
A මෙම ව්‍යාපාරවල ප්‍රධාන ආදායම් මාර්ග සාමාජික මුදල්ය	....
B මෙම ව්‍යාපාරවල හිමිකම සමුච්චිත අරමුදල් ගිණුමෙන් පමණක් නියෝජනය වේ	....
C යාවජීව සාමාජික මුදල් වාරික වශයෙන් ආදායම් ප්‍රකාශනයට වර්ෂයට අදාල මුදල කපා හැරේ	....
D ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක ආදායම් හා වියදම් ගිණුම මුදල් පදනමට පිළියෙල කරයි	....

37 රෙදිපිළි අලවි සැලක සිදුවූ පහත ගනුදෙනු හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්නුම් කරන හිමිකම් ශේෂය වැඩිවේ ද / අඩුවේ ද / වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න

A රෙදිපිළි ණයට මිලදී ගැනීම ....

B ගිනිගැනීමෙන් රෙදිපිළි තොගයක් හානි වීම ....

C දිගුකාලීන බැංකු ණයක් ලබා ගැනීම ....

D ව්‍යාපාරයේ අයිතිකරු විසින් ව්‍යාපාරයේ ණය හිමියෙකුට මුදල් ගෙවීම ....

38 හවුල් ව්‍යාපාර වලට අදාලව පහත සඳහන් ප්‍රකාශ සත්‍ය (T) ද අසත්‍ය (F) ද යන්න සඳහන් කරන්න

සත්‍ය/ අසත්‍ය

(A) හවුල් ව්‍යාපාරයට හවුල්කරුවකු ණය සපයා ඇති අවස්ථාවක ඒ වෙනුවෙන් ගෙවන ණය පොලිය ලා/ලා විසර්ජන ගිණුමේ වාර්තා කරයි ....

(B) හවුල් ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යා නොහැක. ....

(C) හවුල් ව්‍යාපාරයක පවත්නා එකම හිමිකම් ගිණුම වන්නේ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම පමණි. ....

(D) හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ හවුල් කරුවන් අතර සම සමව බෙදා ගත යුතුය. ....

39 පහත සඳහන් එක් එක් ප්‍රතිලාභ ලැබීමට හවුල්කරුවකු ව්‍යාපාරයට දායක විය යුතු ආකාරය දක්වන්න

(A) හවුල් වේතන

....

(B) ලාභ අලාභ

....

40 **2023.04.01** දිනට සමාගමක පැවති කොටස් ප්‍රාග්ධනය රු. **8 000 000** විය. එය සා/කොටස් **100 000** සමන්විත විය.
2023.10.01 දින සමාගම එකක් රු. **75** බැගින් කොටස් **40000** හිමිකම් නිකුතුවක් සිදුකරන ලදී. තවද **2024.01.10** දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් **5:1** බැගින් එකක් රු **70** බැගින් සංචිත ප්‍රාග්ධනීකරණයක් සිදුකරන ලදී.

(අ) සංචිත ප්‍රාග්ධනීකරණයේ වටිනාකම කීයද?

. ...

(ආ) **2024.03.31** දිනට හිමිකමේ ඇතිවූ වෙනස කොපමණ ද?

....

41 **2023.03.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත එරංග පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද්දේ **2024.06.20** දිනය. LKAS 10 "වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්" ප්‍රමිතයට අනුව පහත එක් එක් සිදුවීම් ගළපන සිද්ධීන් ද, නොගළපන සිද්ධීන් ද යන්න සඳහන් කරන්න.

සිද්ධිය	ගළපන / නොගළපන
A **2024.01.01** දිනට සමාගමට එරෙහිව පවරා තිබූ නඩුවක් සඳහා **2024.04.10** දින රු.**500 000** වන්දියක් ගෙවීමට උසාවිය නියෝග කරන ලදී. **2024.03.31** දිනට රු.**300 000** වන්දියක් වෙන් කර තිබුණි.	....
B **2024.06.05** දින ව්‍යාපාරයේ ණයගැතියකු බුන්වත් වූ අතර ඔහුට භාණ්ඩ ණයට විකුණා තිබුණේ **2024.04.05** දිනය.	....
C **2024.03.31** දිනට රු. **400 000** පිරිවැයට සටහන් කර තිබූ තොගයක් **2024.06.25** දින රු. **350 000** ට අලෙවි කිරීම.	....
D කර්මාන්ත ශාලාවේ ඇතිවූ ගින්නකින් **2024.03.31** ට ධාරණ අගය රු. **820 000** වූ යන්ත්‍රයක් විනාශ වීම.	....

42 **2018** වර්ෂයේ හඳුන්වා දෙන ලද මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය තොරතුරු වල වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ගති ලක්ෂණ වන්නේ.

1..

2..

3..

4..

43 **2023.04.01** දින රු.**145 000** මූලික ගෙවීමක් හා රු. **55 000** ක මූලික සෘජු වියදමක් දරා කල්බදු ගිවිසුමක් යටතේ මෝටර් රථයක් ලබා ගත් අතර කල් බදු කාලය වසර **5**ක් හා ඵලදායී ජීව කාලය වසර **6**ක් විය. වාර්ෂික වාරිකය රු.**500 000** වන අතර කල්බදු සඳහා ගම්‍ය පොලී අනුපාතය යටතේ වට්ටම් සාධකය පහත පරිදි විය.

වර්ෂය	වට්ටම් සාධකය
1	**0.89**
2	**0.80**
3	**0.71**
4	**0.64**
5	**0.57**

(a) **2023.04.01** දිනට මූලික කල්බදු වගකීමේ වටිනාකම කොපමණ ද? ....

(b) **2023.04.01** දිනට භාවිත අයිතිය සහිත වත්කම ලෙස හඳුනාගත යුතු වටිනාකම කොපමණ ද

....

44 **2024.03.31 න් අවසන් වර්ෂයේ ව්‍යාපාරයක පහත තොරතුරු සපයා ඇත.**
තොගයේ අඩුවීම ....රු. 14 000 කි.
වෙළෙඳ ගෙවිය යුතු දෑ වල වැඩි වීම..රු. 30 000 කි.
වෙළෙඳ ලැබිය යුතු දෑ වල වැඩි වීම ....රු. 25 000 කි
වර්ෂයට අදාල පොලී වියදම් රු. 10 000 ක් වූ අතර වර්ෂයේ ගෙවූ පොලිය ...රු.8 000 කි.
ස්ථාවර වත්කම් ක්ෂය වීම්...රු. 25 000 කි
ආදායම් බදු රු.15 000 ක් වූ අතර ආදායම් බදු ගෙවීම .... රු.13 000 කි.
මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය .... රු. 150 000

මෙම ව්‍යාපාරයේ 2024.03.31න් අවසන් වර්ෂයේ ලාභය කොපමණද?..

45 **2024 මාර්තු මාසයට අදාලව සීමිත වෙනුර සමාගමේ වැටුප් ලේඛනයේ සේවකයකුට අදාල සාරාංශ ගත තොරතුරු පහත දැක්වේ.**
දළ වැටුප මත EPF **හා** ETF **ගණනය කරයි.**

8% EPF **සේවක දායකය ...රු.4800**
ණය වාරිකය ....රු 3500
වැටුප් අත්තිකාරම්............රු **10000**
සේවක අර්ථසාධක අරමුදල සඳහා සේව්‍ය දායකත්වය 12% හා භාරකාර අරමුදලට 3% දායක වේ නම්

(i) සේවකයාට අදාල මුළු වැටුප් වියදම වනුයේ රු
....

(ii) මාර්තු මාසයේ සේවකයාට ගෙවූ ශුද්ධ වැටුප වන්නේ රු

....

46 පහත එක් එක් ගනුදෙනු හා සිද්ධීන් වාර්ථා කිරීමට යොදාගන්නා ගිණුම් වාර්තා / ලියවිලි ඉදිරියෙන් සඳහන් කරන්න

(i) ගබඩාවේ භාණ්ඩ හිග බව ගැනුම් අංශයට දැනුම් දීම
....

(ii) සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ ගබඩාවට ලැබුණු බව තහවුරු කිරීම
....

(iii) සේවකයින් කිසියම් කාර්යයක ක්‍රියාකාරීව ගතකල කාලය සටහන් කිරීම
....

(iv) ගබඩාවකට තොග ලැබීම් හා නිකුත් කිරීම් වටිනාකම් සහිතව වාර්තා කිරීම
....

47 **පහත එකිනෙක සිදුවීම් වලට අදාලව සමච්ඡේදන විකුණුම් ඒකක ගණන වැඩිවේ, අඩුවේ හෝ වෙනස් නොවේ යන්න සඳහන් කරන්න** **වැඩිවේ/ අඩුවේ/ වෙනස් නොවේ**

A **- ස්ථාවර පිරිවැය ඉහල යාම**
....

B **- ඒකක විචල්‍ය පිරිවැය පහළ යාම**
....

C **- ඒකක විකුණුම් මිල පහළ යාම**
....

D **- අපේක්ෂිත විකුණුම් ඒකක ගණන ඉහළ යාම**
....

48 නිෂ්පාදන ආයතනය එකලස් හා නිමවුම් ලෙස පිරිවැය මධ්‍යස්ථාන 2කින් සමන්විත වේ. සමාගම P නැමති භාණ්ඩයක් නිපදවන අතර ඊට අදාල තොරතුරු පහත දී ඇත. නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණය ඒකක 1500 කි.

	එකලස් අංශය	නිමවුම් අංශය
ඒකකයක් සඳහා ශ්‍රම පැය	4	5
ශ්‍රම පැයක පොදු කාර්ය පිරිවැය	රු200	රු75

අමතර තොරතුරු

- භාණ්ඩ ඒකකයක නිෂ්පාදන පිරිවැයට 20% ක ලාභයක් තබාගන්නා අතර ඒකකයක විකුණුම් මිල රු 2880 කි.

පහත එක් එක් අංශයේ අන්තර්ග්‍රහණය කරන ලද පොදුකාර්ය පිරිවැය වන්නේ,

(i) එකලස් අංශය - ....

(ii) නිමවුම් අංශය - ....

49 පහත තොරතුරු භාවිතයෙන් ආයතනයේ සමච්ඡේද ලක්ෂ්‍යය හා ආරක්ෂිත ආන්තිකය ඒකක වලින් දක්වන්න

- ඒකකයක විචල්‍ය පිරිවැය රු 200
- ඒකකයක් රු. 300 මිල යටතේ අපේක්ෂිත විකුණුම් ඒකක 20,000
- ආයතනයේ ස්ථාවර පිරිවැය රු. 1,000,000

A - සමච්ඡේද ලක්ෂ්‍ය ඒකක - ....

B - ආරක්ෂිත ආන්තිකය ඒකක - ....

50 සමාගමක් තම කර්මාන්ත ශාලාව සඳහා සූර්ය පැනල පද්ධතියක් මිලට ගැනීමට තීරණය කරන ලදී.

එහි පිරිවැය රුපියල් 1,250,000 වේ.
මෙහි ඵලදායී ජීව කාලය වසර 5ක් වන අතර සුන්බුන් අගයක් පනවා නොමැත.
මෙම ව්‍යාපෘතිය තුළින් කර්මාන්ත ශාලාවට වාර්ෂිකව රුපියල් 400,000 කින් ආදායමක් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරයි.
මෙම සූර්ය පැනල පද්ධතිය නඩත්තු කිරීම සඳහා මාසිකව රු10,000 ක් වියදම් දැරීමට සිදුවේ.
සමාගම දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

ව්‍යාපෘතියට අදාළ පහත දෑ ගණනය කරන්න.

(අ) පළමු වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ශුද්ධ මුදල් ප්‍රවාහය රු ....

(ආ) අපේක්ෂිත වාර්ෂික ශුද්ධ ලාභය රු ....

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவமாகாணக்கல்வித்திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2024 -
අවසාන වාර පරීක්ෂණය

ගිණුම්කරණය II
Accounting II

33 S II

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03 மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
மேலதிவாசிப்புநேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

(1) සීමිත සොලෙක්ස් පොදු සමාගමේ 2024.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

රු (000)

දේපළ , පිරියත හා උපකරණ	24 600	
2023.04.01 ට සමුච්චිත ක්ෂය		3 400
භාවිත අයිතිය සහිත වත්කම මෝටර් රථ	3600	
කල්බදු වගකීම		3 600
විකුණුම්		34 600
විකුණුම් පිරිවැය	16 200	
2024.3.31 ට තොගය	5 700	
ලද විකුණුම් අත්තිකාරම්		540
බෙදාහැරීම් වියදම්	4 300	
පරිපාලන වියදම්	6 700	
මූල්‍ය වියදම්	1 200	
වෙනත් වියදම්	2 800	
2023.04.01 ආදායම් බදු වෙන් කිරීම්		150
ගෙවූ ආදායම් බදු	1 020	
වෙළඳ ලැබිය යුතු දෑ	5 600	
වෙළඳ ගෙවිය යුතු දෑ		4 800
මුදල්, මුදල් හා සමාන දෑ	2 400	
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		20 000
2024.04.01 ට රඳවා ගත් ඉපයුම්		6 330
පොදු සංචිත		500
වෙනත් ආදායම්		200
	74 120	74 120

අතිරේක තොරතුරු

01) **2024 .03.31** දිනට පැවති තොගයෙන් පිරිවැය **1,700 000** වූ තොග **2024.05.20** දින මුදලින් රු **200,000** ක පිරිවැයක් දැරීමෙන් පසු රු **1,800,000** ට විකුණා ඇති බව හෙළිදරව් විය. අධ්‍යක්ෂකවරු මූල්‍ය ප්‍රකාශන **2024.06.10** අනුමත කර ඇත.

02) ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති දේ/පි/ උපකරණ වටිනාකම සහ ඒවායේ සමුච්චිත ක්ෂය වල සංයුතිය පහත පරිදි වේ.

විස්තරය	**2024/03/31** පිරිවැය/ප්‍රත්‍යාගණන අගය (රු **000**)	**2023/04/01** සමුච්චිත ක්ෂය (රු **000**)
ඉඩම්	**8 000**	**-**
ගොඩනැගිල්ල	**12 000**	**1 500**
යන්ත්‍ර	**4 600**	**1 900**
	24 600	**3 400**

2024.03.31 දින ව්‍යාපාරයේ පැවති ඉඩම දෙවන වරට ප්‍රත්‍යාගණනය කරන ලද්දේ රු **9,000,000** කටය. මෙම ඉඩම මීට පෙර ප්‍රත්‍යාගණනයෙන් **600,000** ඌනතාවයක් වාර්තා වී ඇත. ප්‍රවර්තන වර්ෂයේ ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ගැලපීමක් සිදු කොට නොතිබිණි.

03) **2023.04.01** දින රු **500,000** වියදමක් දරා ගොඩනැගිල්ල නවීකරණය කරන ලද අතර එම වටිනාකම අලුත්වැඩියා වියදමක් ලෙස සලකා පරිපාලන වියදම් තුල ඇතුලත් කොට ඇත. නවීකරණයෙන් පසු ගොඩනැගිල්ලෙහි ඉතිරි ඵලදායී ජීව කාලය අවුරුදු **22** බවට ඇස්තමේන්තු කොට ඇත. මේ පිළිබඳ වෙනත් කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

04) **2023.09.30** දින පිරිවැය රු **2,000,000** වූ යන්ත්‍රයක් රු **1,300,000** කට විකුණා අත්පිට විකුණුම් ලෙස ගිණුම් ගත කොට තිබුණි. මෙම යන්ත්‍රය **2020.09.30** දින මිළට ගෙන තිබූ අතර ඉවත් කිරීමට අදාළ වෙනත් කිසිදු සටහනක් තබා නොතිබුණි. යන්ත්‍ර වාර්ෂිකව **10%** සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

05) **2024.03.01** දින ඉදිරි මාස **3** ක කාලයක් සඳහා භාණ්ඩ සැපයීම වෙනුවෙන් ලද අත්තිකාරම ශේෂ පිරික්සුමෙන් දැක්වේ. **2024.03.31** දින වන විට ඉන් **1/3**ක වටිනාකම් සහිත භාණ්ඩ අදාළ ගනුදෙනුකරුවෙත නිසි පරිදි සපයා තිබුණි.

06) **2023.04.01** දින කල්බදු ගිවිසුමක් යටතේ මෝටර් රථයක් අත්පත් කරගන්නා ලදී. එහි ආරම්භක කල්බදු වගකීම භාවිත අයිතිය සහිත වත්කම් ගිණුම හර කර කල්බදු වගකීම් ගිණුම බැර කර තිබුණි. සමාගම විසින් මූලික තැන්පතුව ලෙස රු **1,000,000** ක්ද සෘජු වියදම් ලෙස රු **400,000** මුදලින් දරා එය බෙදා හැරීමේ වියදම් තුළ ඇතුළත් කර තිබුණි. වාර්ෂික කල්බදු වාරිකය රු**1,000,000** වූ අතර **2024.3.31** දිනට නියමිත වාරිකය ගෙවා නොතිබුණි. **2023/2024** , **2024/2025** යන ගිණුම් වර්ෂ සඳහා කල්බදු පොලිය පිළිවෙලින් රු **460,000** හා රු **400,000** විය. මෝටර් රථයේ ඵලදායී ජීව කාලය හා කල්බදු ගිවිසුම් කාලය පිළිවෙළින් අවුරුදු **08** හා අවුරුදු **05** වේ. කල් බදු කාලය අවසානයේ වත්කම ගැනුම්කරු සතුවේ.

07) සමාගම අලෙවි කරන භාණ්ඩ වෙනුවෙන් වගකීම් සහතිකයක් ලබාදීමට ප්‍රවර්තන වර්ෂයේ සිට සැලසුම් කර ඇත. ඒ සඳහා **2024.03.31** දිනට වගකීම් සහතික ලෙස රු **760 000** වෙන් කිරීමට තීරණය කර ඇත.

08) වර්ෂයට අදාලව ගෙවූ විගණන ගාස්තු රු **700,000** පරිපාලන වියදම් තුළ ඇතුළත් අතර තවත් රු **150,000** උපචිතව ඇත. තවද වර්ෂය තුළ ගෙවූ අතුරු ලාභාංශ රු.**300,000** වෙනත් වියදම් තුල සටහන් කොට තිබුණි.

09) ගෙවූ බදු තුලින් නිරූපණය වන්නේ පෙර වර්ෂයේ අවසන් කාර්තුව සඳහා ගෙවූ රු **120,000** හා ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවා ඇති ආදායම් බදුයි. ප්‍රවර්තන වර්ෂය සඳහා මුළු ආදායම් බදු ඇස්තමේන්තුව රු **1,150** කි.

10) **2024.03.31** දිනට අධ්‍යක්ෂක මණ්ඩලය පහත යෝජනා ඉදිරිපත් කර ඇත.

i) පොදු සංචිතයට රු **150,000** මාරු කිරීම.

ii) සාමාන්‍ය කොටස්කරුවන් සඳහා කොටසකට රු **2** ලාභාංශයක් ගෙවීම.

අවශ්‍ය වන්නේ,

LKAS – 01 ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සොලෙක්ස් සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් සහිතව)

i) **2024.03.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.
ii) **2024.03.31** න් අවසන් වර්ෂයේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.
iii) **2024.03.31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ල.40)

(2)

(අ) සීමිත කේශර පොදු සමාගම විසින් අලෙවි කරනු ලබන තොග අයිතමයකට අදාළ **2024** ජනවාරි මාසයේ තොරතුරු පහත දී ඇත.

දිනය	විස්තරය	ප්‍රමාණය (ඒකක)	ඒකක පිරිවැය (රු)
01/01	ආරම්භක ශේෂය	**800**	**22**
01/05	ගැනුම්	**450**	**24**
01/10	විකුණුම්	**500**	**....?.....**
01/15	ගැනුම්	**100**	**25**
01/25	විකුණුම්	**450**	**....?.....**
01/31	විකුණුම්	**350**	**....?.....**

අවශ්‍ය වන්නේ,

(1) පෙර පිවිසි පෙර පිට (**FIFO**) ක්‍රමයට අනුව තොග ලෙජරය ඇසුරින් **2024/01/31** දිනට තොගයේ පිරිවැය

(2) පෙර පිවිසි පෙර පිට (**FIFO**) ක්‍රමයට අනුව **2024** ජනවාරි මාසය සඳහා විකුණුම් පිරිවැය

(3) භරිත සාමාන්‍ය පිරිවැය (**WAC**) ක්‍රමය අනුව තොග ලෙජරය ඇසුරින් **2024/01/31** දිනට තොගයේ පිරිවැය හා **2024** ජනවාරි මාසය සඳහා විකුණුම් පිරිවැය (ල16)

(ආ) නිෂ්පාදන සමාගමක් විසින් **"R"** සහ **"S"** නම් වූ භාණ්ඩ **2**ක් නිෂ්පාදනය කරනු ලැබේ. මෙම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා "එකලස් " සහ "නිමවුම් " නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් හා "ගබඩාව " යන සේවා පිරිවැය මධ්‍යස්ථානයක් මෙම සමාගම සතුවේ. මෙම සියලුම පිරිවැය මධ්‍යස්ථාන එකම පරිශ්‍රයක පිහිටා ඇත.

2023/2024 වර්ෂයට අදාළ අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

විස්තරය	එකතුව රු	එකලස් රු	නිමවුම් රු	ගබඩාව රු
නිෂ්පාදන කළමනාකරණ වේතන	**410,000**	305,000	105,000	**-**
නඩත්තු පිරිවැය	**40,000**	**20,000**	**-**	**20,000**
වක්‍ර වේතන	**800,000**	?	?	?
විදුලිය	**300,000**	?	?	?
යන්ත්‍ර ක්ෂය	**120,000**	?	?	**-**
ගොඩනැගිලි රක්ෂණය	**150,000**	?	?	?

අතිරේක තොරතුරු

1) පිරිවැය මධ්‍යස්ථාන වලට අදාල තොරතුරු

	එකලස්	නිමවුම්	ගබඩාව
සේවක සංඛ්‍යාව	40	20	20
කිලෝවොට් පැය	150	100	50
යන්ත්‍ර පිරිවැය	800,000	400,000	-
භූමි ප්‍රමාණය (වර්ග මීටර්)	9000	3000	3000
අයවැය ගත යන්ත්‍ර පැය	30	20	-
අයවැය ගත ශ්‍රම පැය	22	25	-

2) ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය 2:1 අනුපාතයට "එකලස්" හා "නිමවුම්" පිරිවැය මධ්‍යස්ථාන අතර නැවත විභජනය කරනු ලබයි.
3) එකලස් හා නිමවුම් පිරිවැය මධ්‍යස්ථාන වල පොදුකාර්ය පිරිවැය පිළිවෙළින් යන්ත්‍රපැය හා ශ්‍රමපැය පදනම මත භාණ්ඩ වලට අන්තර්ග්‍රහණය කරනු ලබයි.
4) “R” සහ “S” භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අදාළ තොරතුරු පහත දී ඇත.

	R	S
සෘජු අමුද්‍රව්‍ය පිරිවැය	150	80
සෘජු ශ්‍රම පිරිවැය	70	60
සත්‍ය යන්ත්‍ර පැය - එකලස්	3	2
- නිමවුම්	2	3
සත්‍ය ශ්‍රම පැය - එකලස්	3	5
-නිමවුම්	5	3
විකුණුම් මිල මත ලාභ ආන්තිකය	25%	20%

අවශ්‍ය වන්නේ ,

1) විභජන පදනම පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
2) එකලස් හා නිමවුම් දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත
3) “R” භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය
4) “S” භාණ්ඩ ඒකකයක විකුණුම් මිල (ල24)

(3)

(අ) සාගර නිම් ඇදුම් අලෙවි ව්‍යාපාරයක් 2024 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර ජනවාරි මාසය තුල සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය තුල පහත පරිදි ඇතුලත් කර ඇත.

(රු000)

	වත්කම්				වගකීම්		හිමිකම්
ගනුදෙනු අංකය	දේපල පිරියත උපකරණ	තොගය	වෙළෙඳ ලැබිය යුතු දෑ	මුදල්	බැංකු ණය	වෙළෙඳ ගෙවිය යුතු දෑ	හිමිකම්
01	+3000			+1000			+4000
02		+500		-500			
03		-300	+350				+50
04		+200				+200	
05		-100		+75			-25
06				-10			-10
07				+1000	+1000		
08	-25						-25
09		-10					-10
10			-200	+180			-20
11				+50			+50
12						-200	+180 +20
13	+50			+60 -50			+60

අමතර තොරතුරු,

- ඉහත ගනුදෙනු වලින් **9,11** සහ **13** යන ගනුදෙනු පමණක් ශුද්ධ ලාභයට බලපෑමක් ඇති නොකරයි.

  අවශ්‍ය වන්නේ,
  1) ඉහත ගිණුම්කරණ සමීකරණය තුල දක්වා ඇති අංක **1** සිට **13** දක්වා ගනුදෙනු වටිනාකම සහිතව විස්තර කරන්න.
  2) සාගර ව්‍යාපාරයේ **2024** ජනවාරි මාසය සඳහා ආදායම් ප්‍රකාශනය **(ල 25)**

(ආ) එකමුතු සුභ සාධක සංගමයේ **2024/3/31** න් අවසන් වූ වර්ෂයට අදාල පහත තොරතුරු ලබා දී ඇත.

* සුභ සාධක සංගමයේ ප්‍රවර්ධනය සඳහා ආපන ශාලාවක් පවත්වාගෙන යයි.

- **2024/3/31** න් අවසන් වර්ෂයට අදාල එකමුතු සුභ සාධක සංගමයේ මුදල් ගිණුම පහත දැක්වේ.

මුදල් ගිණුම (රු 000)

සාමාජික මුදල් ලැබීම්	1100	ආපන ශාලා ගැනුම්	50
ආපන ශාලා ලැබීම්	120	සේවක වේතන	40
යාවජීව සාමාජික මුදල්	60	ලිපි ද්‍රව්‍ය	20
ඇතුළත් වීමේ ගාස්තු	60	රක්ෂණය	10
		පත්තර මිලදීගැනීම්	15
		ආපන ශාලා වියදම්	15
		ප/ගේ ශේෂය	1190
	1340		1340
ඉ/ගෙ/ගෙ ශේෂය	1190		

අතිරේක තොරතුරු.

- ආපන ශාලාවේ ආරම්භක ආහාර තොගය රු 10,000 ක්වේ.
- ගෙවූ වේතන වලින් 10% ක් ආපන ශාලා සේවකයින්ට අදාළ වේ.
